**ජාතික විද්‍යා පදනම - 2013**

---------------------------

ජාතික විද්‍යා පදනමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3)සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 21(ඇ) ඡේදය පරිදි ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) පදනමේ ස්ථාවර වත්කම් ලේඛණය අනුව ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.2,867,952 ක් වූ අතර අවසාන මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. 2,988,043 ක් වූයෙන් රු.120,091 ක වෙනසක් විය.

ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය රු.4,032,802 ක් වූ අතර භාණ්ඩාගාර ශේෂ සනාථ කිරීම් අනුව එම වටිනාකම රු.3,298,965 ක් වූයෙන් රු.733,837 ක් වූ වෙනසට හේතූන් ඉදිරිපත් නොවුනි.

**2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 ඡේදය. | රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රාජ්‍ය සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අනුමැතිය ලබා නොගෙන උපදේශකවරියන් දෙදෙනෙක් සේවයේ යොදවා සමාලෝචිත වර්ෂයේ දී රු. 781,238 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 (අ) | පදනම සතුව වාහන 07 ක් පවතින අතර, මෙම වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබිණි. |
| (ඇ) 1985 අංක 01 දරන සේවක අර්ථ සාධක අරමුදල් සංශෝධන පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 09 ඡේදයේ 02 වගන්තිය | පදනමේ සේවකයන් 125 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගණනය කිරීමේදී සියලු දීමනා සහිත වැටුප යොදාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.4,764,926 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.8,247,108 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,482,182 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර මෙම ඌනතාවය අඩුවීම කෙරෙහි රජයේ ප්‍රදාන රු.9,409,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව පදනමේ කාරක ප්‍රාග්ධන අනුපාත විශ්ලේෂණය පහත දැක්වේ.

| අනුපාතය | 2013 | 2012 |
|---|---|---|
| ජංගම | 1.05:1 | 2.60:1 |
| ක්ෂණික | 0.94:1 | 2.25:1 |

පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට පදනමේ කෙටි කාලීන බැරකම් පියවීමේ හැකියාව සතුටුදායක මට්ටමක නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍ර දිනට ජංගම වත්කම් තුළ, මුදල් හා මුදල් සමාන දෑ වල නියෝජනය සියයට 32 ක් පමණ වන අතර, තොගය තුළ සියයට 56 ක් නියෝජනය කරනුයේ වසර 05ක සිට පැවත එන ප්‍රකාශන තොගය වන අතර එය උපලබ්ධිකර ගැනීම අවිනිශ්චිත වේ.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011, 2012 හා 2013 වර්ෂවලදී පදනම විසින් රු.105,445,038 ක් වටිනා පර්යේෂණ 86 ක් නිම කර තිබුණු අතර නිම කරන ලද පර්යේෂණවලින් ප්‍රායෝගිකව භාවිතා කල හැකි පර්යේෂණ සංඛ්‍යාව 09 ක් විය.

(ආ) 2010,2011 හා 2012 යන වර්ෂයන්හි සම්පූර්ණ කරන ලද පර්යේෂණවල අවසන් ප්‍රතිඵලයන් ලෙස දේශීය සහ විදේශීය විද්‍යාත්මක ප්‍රකාශන පලකිරීම, පශ්චාත් දර්ශනපති, දර්ශනශූරි උපාධි සඳහා යොදාගැනීම හා ජනාධිපති සම්මාන ආදිය සඳහා නිර්දේශ වීම හැරුණු විට රු.81,666,303 ක් වටිනා පර්යේෂණ ප්‍රදානයන් 67 ක් වාර්තාවකට පමණක් සීමා වී තිබුණි.

**4.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ කළමනාකරණ තොරතුරු පද්ධතිය පරිගණකගත කිරීම වෙනුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක පාසල සමඟ 2011 පෙබරවාරි මාසයේ 15 දින රු.2,999,000 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබූ අතර, එම කාර්ය 2012 ජුනි 14 දින වන විටනිම කළ යුතු විය. එසේ වුවත් 2014 ජුනි 10 දක්වාම කටයුතු නිම කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,157,000 ක වියදමක් දරා තිබුණි.

(ආ) පදනම විසින් එක් එක් අංශ යටතේ ලබා දී ඇති පර්යේෂණ ප්‍රදානයන් පිළිබඳ දත්ත සමුදායක් නොතිබූ අතර, පරීක්ෂා කරන ලද පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් පහත අඩුපාඩු පැවතුණි.

i. නියමිත කාලසීමාව වසරකට වඩා ඉක්මවා තිබූ රු.3,461,802 ක් වන පර්යේෂණ 4 ක් සඳහා අවසන් වාර්තා ලබාදීමේ කාලය තවදුරටත් දීර්ඝ කර තිබුණි.

ii. නිම කරන ලද රු.10,810,722 ක් වූ පර්යේෂණ 9 කට අදාළ වාර්තා ඇගැයීම සඳහා නියමිත කාල සීමාව ඉක්ම වී මාස 02 සිට මාස 09 දක්වා කාලයක් ගතකර තිබුණි.

iii. වටිනාකම රු.7,107,584 ක් වූ පර්යේෂණ ප්‍රදාන 06ක් නිම කළ යුතු කාලය අවසන් වී තිබුණද 2014 ජනවාරි මාසය වන විටත් අදාළ පර්යේෂණ අවසන් කර නොතිබුණි.

**4.3** **ඌන උපයෝජිත වත්කම්**

පෞද්ගලික සමාගමක් විසින්2013 දෙසැම්බර් 25 දින වන විට ඉදිකිරීම් නිමකර භාර දී තිබුණු පිරිවැය රු.7,284,200 ක් වූ කන්ටේනර් කාර්යාල ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4** **කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වේ.

| තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක | 63 | 50 | 13 |
| විධායක නොවන | 81 | 76 | 05 |
| | 144 | 126 | 18 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මාර්තු මාසයේ සිට 2013 දෙසැම්බර් 17 දක්වා පරිපාලන හා ගිණුම් කටයුතු සඳහා විශ්‍රාමික නිලධාරිනියෙකු බඳවා ගෙන තිබූ අතර ඇය විසින් සකස් කරන ලද කාර්ය පටිපාටි සංග්‍රහය (MOP) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2012 මැයි 24 දින ඉදිරිපත් කර තිබුණ ද 2013 දෙසැම්බර් 31 දක්වා ඒ සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි.

(ආ) වාර්ෂික වාර්තා කටයුතු, සඟරා ප්‍රකාශනයට පත් කිරීමේ කටයුතු හා ප්‍රාදේශීය මට්ටමේ විද්‍යා දින වැඩසටහන් ආදී කටයුතු සඳහා අදාළ අංශවල ප්‍රධානින් හා කාර්ය මණ්ඩලය සිටියදීත් එම කාර්යයන් සඳහා සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරිනියක් 2011 ජූලි 27 දින උපදේශිකාවක් ලෙස බඳවාගෙන තිබුණි. මෙම නිලධාරිනිය වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දක්වා රු.1,012,190 ක දීමනා ගෙවා තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර පදනමේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කල යුතු වේ.

අ) පර්යේෂණ ප්‍රදාන

ආ) ප්‍රකාශන තොගය

ඇ) ස්ථාවර වත්කම්

ඈ) ගිණුම්කරණය

ඉ) වත්කම් උපයෝජනය